# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2240/20 - 2021 අගෝස්තු මස 11 වැනි බදාදා - 2021.08.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය සහ 5 වැනි වගන්තිය යටතේ නියමය

1. 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළෙඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

*උපලේඛනය*

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| *වෙළෙඳ භාණ්ඩය* | | | | |
| | *සං. ව. ශීර්ෂය* | *සං. ව. සංකේතය* | *විස්තරය* | *විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද* |
| 1 | 03.05 | 0305.54.10 | හාල් මැස්සන් | කි. ග්‍රෑමයකට රු. 100 |
| 2 | | 0305.52.00<br>0305.53.00<br>0305.54.90<br>0305.59.30<br>0305.59.90 | කරවල | කි. ග්‍රෑමයකට රු. 100 |
| 3 | 04.05 | 0405.10 | වෙඩරු | කි. ග්‍රෑමයකට රු. 880 |
| | | 0405.20 | කිරිවලින් නිපදවූ තැවරුම් | කි. ග්‍රෑමයකට රු. 880 |
| | | 0405.90 | අනෙකුත් | කි. ග්‍රෑමයකට රු. 880 |


1A - G 34537 — 495 (2021/08)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| *වෙළෙඳ භාණ්ඩය* | | | | *විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද* |
| | *සං. ව. ශීර්ෂය* | *සං. ව. සංකේතය* | *විස්තරය* | |
| 4 | 09.10 | 0910.99.10 | උළුහාල් ඇට | කි. ග්‍රෑමයකට රු. 50 |
| 5 | 11.02 | 1102.90.20 | කුරක්කන් පිටි | කි. ග්‍රෑමයකට රු. 150 |
| 6 | 12.07 | 1207.50 | අබ ඇට | කි. ග්‍රෑමයකට රු. 62 |
| 7 | 25.01 | 2501.00 | ජලීය ආකාරයේ හෝ එසේ නොවන ආකාරයෙන් වූ හෝ එකතු කරන ලද කැටි නොගැසීමේ කාරකයෝ නිදහසේ පාවීම සඳහා වන ද්‍රව්‍යයන් අඩංගුවන්නාවූ, ශුද්ධ සෝඩියම් ක්ලෝරයිඩ හෝ ලුණු (මේස ලුණු සහ ස්වභාවික තත්ත්වය වෙනස් කළ ලුණු ඇතුළුව) මුහුදු ජලය | කි. ග්‍රෑමයකට රු. 40 |

2. 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉහත උපලේඛනය මගින් දක්වා ඇති සංයෝජිත වර්ගීකරණ අංක 2501.00 යටතට වැටෙන ලුණු (Sodium Chloride B.P.) ආනයනය සඳහා අදාළ වන කිලෝ ග්‍රෑමයකට රු. 40ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝ ග්‍රෑමයකට රු. 10ක් අයකරගෙන ඉතිරි වටිනාකම, ඖෂධ නිෂ්පාදනය. සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශයට යටත්ව, ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) යටතේ ලියාපදිංචි වානිජ පරමාර්ථයෙන් තොරව ඖෂධ නිෂ්පාදනය කරන ඕනෑම ඖෂධ නිෂ්පාදන ආයතනයක් සඳහා අත්හරිනු ලැබිය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

3. මෙම නියමය 2021 අගෝස්තු මස 12 වැනි දින සිට ආරම්භ වන වසරක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

4. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2020 සැප්තැම්බර් මස 30 දිනැති අංක 2195/29 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත නියමය සහ 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ පනවන ලද 2020 දෙසැම්බර් මස 16 දිනැති අංක 2206/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත නියමය 2021 අගෝස්තු මස 12 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

**බැසිල් රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 අගෝස්තු මස 10 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.